# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
# ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින **වෙබ් සංස්කාරක (ඉංග්‍රීසි/සිංහල)** තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2025.09.21** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය).

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01**

1. **වැටුප් පරිමාණය:-**
   2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.74,810-9x1,360/6x1,670-97,070/- වේ (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.114,715/- පමණ වේ).

2. **වයස් සීමාව:-**
   අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

3. **අධ්‍යාපන සුදුසුකම්:-**
   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු පද්ධති පිළිබඳ උපාධියක් තිබීම

   **සහ**

   සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම.

4. **වෘත්තීය සුදුසුකම්:-**
   පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද Java වැනි ක්‍රමලේඛන භාෂා සහ Java Script හා PHP වැනි ස්ක්‍රිප්ටින් භාෂා පිළිබඳ සහතිකයක් ලබා තිබීම

   **සහ**

   MySQL/MSSQL වැනි දත්ත පදනම් කළමනාකරණ පද්ධති සහ Apache, IIS වැනි වෙබ් සර්වර් පිළිබඳ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

5. **පළපුරුද්ද:-**
   සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වෙබ් සංස්කරණය හෝ සංවර්ධනය පිළිබඳ වසර තුනක (03) පළපුරුද්දක් තිබීම.

6. **බඳවා ගැනීමේ ක්‍රමය:-**
   ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

7. **පරීක්ෂණ පටිපාටිය:-**

   (අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයේ දී රැකියා කාර්යභාරය හා සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

(ආ) සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයෙන් ලකුණු හතළිහකට (40) ඉහළ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100):-

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | රැකියා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**8. සේවා නියමයන් හා කොන්දේසි:-**

**(i)** මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

**(ii)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

**(iii)** තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

**(iv)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

**(v)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

**9.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය:-

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**10.** රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**11.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**12.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**13.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2025 .................... වැනි දින.